# 2022 දෙසැම්බර් මස මාසික සභා රැස්වීම

## වැලිගෙපොල ප්‍රාදේශීය සභාව

2022 දෙසැම්බර් මස මාසික සභා රැස්වීම 2022.12.15 වන දින පෙ.ව.10.00 ට ගරු සභාපති කැළුම් ප්‍රියංකර ජයසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී පවත්වනු ලැබීය.

එදින සභා රැස්වීමට පහත නම් සඳහන් අය සහභාගී වූහ.

1. ගරු උප සභාපති - ඩබ්ලිව්.ඒ.සමන්ජීවලාල් වීරසිංහ මැතිතුමා
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ජී.ජී.සිසිර ප්‍රේමකුමාර මැතිතුමා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ආර්.ඒ.රෝහණ විජේරත්න මැතිතුමා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.බුද්ධික විරසිංහ මැතිතුමා
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.එච්.සිරිපාල මැතිතුමා
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.එම්.ඉන්ද්‍රජිත් සමන්ජීව මැතිතුමා
7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එම්.ආර්.රත්නපාල මැතිතුමා
8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.එම්.අයි.පී.රණතුංග මැතිතුමා
9. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ජී.එල්.ලාල් කුමාරරත්න මැතිතුමා
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - එන්.වී.ශ්‍රීමාවතී මැතිතුමිය
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.ජී.ශාන්ත දෙල්ගහකොටුව මැතිතුමා
12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.කේ.ප්‍රසාද් අසිත මැතිතුමා
13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - ඒ.ඩබ්ලිව්.සුමනාවතීමැතිතුමිය
14. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - පී.ආර්.එස්.ධම්මිකා මැතිතුමිය
15. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - වයි.කේ.අයි.තමරා කුමාරි යටිකිඳ මැතිතුමිය
16. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එන්.ජී.යූ.ඩබ්ලිව්.කුමාර මැතිතුමා

18.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - අචිනි එස්.අබේවික්‍රම මැතිතුමිය

## නිලධාරී සහභාගීත්වය

1. ප්‍රාදේශීය සභාවේ ලේකම් - එස්.එච්.ඒ.කරුණාරත්න මිය
2. කළමනාකරණ සේවා නිලධාරී - පී.කේ.ඩී.සී.කුමාරි මිය

මෙදින සභා රැස්වීමට සහභාගී වූ ගරු සභාපතිතුමා විසින් මන්ත්‍රී මණ්ඩලයත්,ලේකම් තුමිය ඇතුළු කාර්යමණ්ඩලයත්,මාධ්‍යවේදී මහතාත් පිළිගැනීමෙන් අනතුරුව සභාවේ කටයුතු ආරම්භ කරන ලදී.

### 1. පසුගිය සභා රැස්වීමේ වාර්තාව සහා සම්මත කිරීම

2022.11.10 වන දින මාසික සභා රැස්වීම් වාර්තාවේ සංශෝධනයන් ලෙස, 2023 අයවැය කෙටුම්පත ඒකමතිකව සභා සම්මත වූ බවට පසුගිය සභ වාර්තාවේ සඳහන් වුවද ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ජී.යූ.ඩබ්.කුමාර මැතිතුමා විසින් 2023 අයවැය කෙටුම්පතට සඳහා සිය විරෝධය දැක්වූ අතර සෙසු මන්ත්‍රීවරුන්ගේ එකගතාව අනුව 2023 අයවැය කෙටුම්පත සභා සම්මත වූ බවට එය සංශෝධනය විය යුතු අතර එය පසුගිය වාර්තාවේ සංශෝධනය වියයුතු බව ගරු මන්ත්‍රීතුමා විසින් සඳහන් කරන ලද සංශෝධනය සහ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී පී.ආර්.එස්.ධම්මිකා මැතිතුමිය විසින් පෙර සභා වාරයේදී යටිපස්ගමුව පාර සම්බන්ධව ස්ථාන පරීක්ෂාවක් සිදු කර ඉදිරි කටයුතු කරන ලෙස සඳහන් කළද එය

පසුගිය සභා වාර්තාවේ සඳහන් නොවීම පිළිබඳ ද ගරු මන්ත්‍රීතුමිය විසින් සඳහන් කරන ලද සංශෝධනයන්ට යටත්ව පසුගිය සභා වාර්තාව සත්‍ය වාර්තාවක් බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.ශාන්ත කුසුම් කුමාර මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ඒ.ඩබ්.සුමනාවතී මැතිතුමිය විසින් ස්ථිර කිරීමෙන් පසු ඒකමතිකව සභා සම්මත විය.
2022.11.15 දින පැවති විශේෂ සභා වාර්තාවද සත්‍ය වාර්තාවක් බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එච්.සිරිපාල මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී එන්.වී.ශ්‍රීමාවතී මැතිතුමිය විසින් ස්ථිර කිරීමෙන් පසු ඒකමතිකව සභා සම්මත විය.

## 2. ගරු සභාපතිතුමාගේ නිවේදන

### 2.1. ජල බිල්පතේ නම සංශෝධනය කිරීම

- ඩබ්.විල්සන් වීරවත්ත නමින් ඇති අංක UD - 213 දරණ ජල බිල්පත ජේ.සමන්ත කමල්සිරි නමින් සංශෝධනය වන බව සභාවේ දැනගැනීම සඳහා ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලදී.

### 2.2. ක්‍රියාත්මක කළයුතු අධි අවධානම් සංවර්ධන ව්‍යාපෘති පිළිබඳ නිරීක්ෂණ වාර්තා ලබා ගැනීම

මෙම කොට්ඨාසයේ මේ වන විට සාමාන්‍ය ජනතාවගේ ජන ජීවිතය අඩාල වීමට හේතු වී ඇති යටිතල පහසුකම් සම්බන්ධයෙන් ලබාගත් වාර්තා අනුව,

- කොස්ඇටදෙනිය නො.06 කොටස සඳහා යන මාර්ගය 500m ක් පමණ සංවර්ධනය කිරීම.
- හෙළඋඩ කුකුලන්ද මාර්ගයේ සුනිල් ස්ටෝර්ස් අසල ගලවාගෙන ගොස් ඇති බෝක්කුව හියුං පයිප්ප යොදා සංවර්ධනය කිරීම.
- උඩුකුඹුර මීගස්දෙනිය මාර්ගයේ මාබරණ මහතාගේ නිවස අසල බෝක්කුව ඉදිකිරීම.
- පැලැන්දකන්ද විද්‍යාලයට යන මාර්ගයේ රිලා දොළට පාලමක් ඉදිකිරීම.
- මැටිහක්වල විද්‍යාලය අසල සිට ගල්ලින්නාවත්ත මාර්ගය 80m ක් පමණ සංවර්ධනය කිරීම.
- බෝගහකුඹුර පි.කේ.පුංචිපාල මහතාගේ නිවස අසල පැති බැම්මේ ඉතිරි කොටස ඉදිකිරීම.

යන ඉහත සඳහන් සංවර්ධන ව්‍යාපෘති කඩිනමින් ක්‍රියාත්මක කළ යුතු බැවින්මේ වන විට රාජ්‍ය ප්‍රතිපාදන මේ සඳහා වෙන් නොවූවද අප ආයතනයේ සෘජු වගකීම යටතේ මෙම සංවර්ධන අවශ්‍යතා සම්බන්ධයෙන් කඩිනමින් අවධානය යොමුකර ඒ පිළිබඳව ගත හැකි ක්‍රියාමාර්ග ඔපනායක, ප්‍රාදේශීය ලේකම්තුමා වෙත දන්වා එවන ලෙසත්, 2022.12.16 දින ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේදී මේ සම්බන්ධව දැනුවත් කරන ලෙසත් දන්වා එවා තිබූ ලිපිය, ගරු සභාපතිතුමා විසින් සභාවේ දැනගැනිම පිණිස ඉදිරිපත් කරන ලදි.

### 2.3. වත්කම් හා බැරකම් ප්‍රකාශ ලබා ගැනීම

පළාත් පාලන ආයතනවල මහජන නියෝජිතයින්ගේ වත්කම් හා බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කරන ලෙස දැනුවත් කරනු ලැබුවද මේ වන විටත් මෙම දෙපාර්තමේන්තුව වෙත බොහොමයක් පළාත් පාලන ආයතන වලින් එම ප්‍රකාශ ලබාදීමට කටයුතු කරනොමැති බැවින් මෙම කරුණ සම්බන්ධයෙන් විගණනයෙන්ද නිරන්තර විමසීම් කරනු ලබන බැවින්ද මෙම කාර්ය ඉටු කිරිම නෛතික අවශ්‍යතාවයක් බවද අදාළ මහජන නියෝජිතයින් වෙත ඉදිරි ආසන්නතම මහා සභාවේදී දැනුවත් කර මුද්‍රා තබන ලද එකී මහජන නියෝජිතයින්ගේ වත්කම් හා බැරකම් ප්‍රකාශ කඩිනමින් මා වෙත ලැබීමට සලස්වන ලෙසට දන්වා එවා තිබූ ලිපිය, ගරු සභාපතිතුමා විසින් සභාවේ දැනගැනිම පිණිස ඉදිරිපත් කරන ලදි.

## 3. <u>සභාව නමින් ලැබී ඇති ලිපි,පෙත්සම් හා පැමිණිලි ඉදිරිපත් කිරීම</u>

### 3.1. නිවාඩු අනුමත කර ගැනීම.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.ජ්.ගුණතිලක මැතිතුමා සහ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ජ්.දමිත් විජේරත්න මැතිතුමා අසනීප වීම හේතුවෙන් අද දින සභා රැස්වීමට සහභාගී නොවන බව දන්වා එවා ඇති බැවින්, නිවාඩු අනුමත කිරීම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.සිසිර ප්‍රේමකුමාර මැතිතුමා විසින් යෝජනා කිරීමෙන් හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.බුද්ධික වීරසිංහ මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් පසුව එම නිවාඩු අනුමත විය.

### 3.2. පුණ්‍යානුමෝදනා පූර්වක ස්තූතිය පළ කිරීම.

කීරපත්දෙනිය ශ්‍රී විජයාරාම විහාරාධිපතිව වැඩ සිටි අපවත් වී වදාළ ගුරුදේවොත්තම රාජකීය පණ්ඩිත කෝන්ගස්තැන්නේ විජයවංශ නායක හිමියන්ගේ ආදාහන පූජෝත්සවය ඉතා සාර්ථකව සිදුකර ගැනීම සඳහා ගරු සභාපතිතුමා ඇතුළු කාර්ය මණ්ඩලය දක්වන ලද අමිල වූ සහයෝගය අගය කර අතර විහාරාධිපති, පූජ්‍ය ගුරුබැව්ලාගම විජයමූර්ති හිමියන්ගේ සහ විහාරස්ථ දායක සභාවේත් පුණ්‍යානුමෝදනා පූර්වක ස්තූතිය පුද කරනු ලැබූ ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාවේ දැන ගැනීම පිණිස ඉදිරිපත් කරන ලදි.

## 4. <u>යථා පරිදි කල්දී ඇති ප්‍රශ්න</u>

යථා පරිදි කල්දී ඇති ප්‍රශ්න කිසිවක් නොවීය**.**

## 5. <u>කල් දී ඇති යෝජනා</u>

### 5.1. ගරු සභාපති කැළුම් ප්‍රියංකර ජයසිංහ මැතිතුමා

ගරු සභාපතිතුමා විසින් පහත සඳහන් යෝජනා සභාවට ඉදිරිපත් කරන ලදී.

I   හෙළ බොජුන්හලේ සූර්යය පැනලයක් ස්ථාපිත කිරීමේ පළමු අදියර සඳහා වන ඉන්වේටරය වෙනුවෙන් රු.818,170.00 ක මුදල ගෙවීමට අනුමැතිය ලබා ගැනීම අවශ්‍ය බව යෝජනා කරන ලදි.

එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එන්.ජී.උපුල් වසන්ත කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දැක්වූ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී. බුද්ධික වීරසිංහ මැතිතුමා, හෙළ බොජුන්හලෙහි මේ දක්වා වූ ආදායම විමසූ අතර මෙම සූර්ය පැනල හැර සියලු වියදම් සහ ප්‍රති සංවර්ධනයන් බොජුන්හලෙන් ලැබෙන ආදායම අනුව කළ හැකිනම් වඩාත් සුදුසු බව ප්‍රකාශ කළේය.

හෙළ බොජුන්හලේ මේ වන විට ආදායම, සේවකයන් ගණන, සූර්යය පැනල පිරිවැය, ආදී සම්පූර්ණ වියදම පිළිබඳ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ජී.යූ.ඩබ්ලිව්.කුමාර මැතිතුමා විමසූ අතර ඒ පිළිබඳ සවිස්තර වාර්තාවක් අවශ්‍ය බවත් ප්‍රකාශ කළේය.

මෙහිදී අදහස් දැක්වූ ගරු සභාපතිතුමා, හෙළ බොජුන්හලේ සැප්.01- නොවැ.31 දක්වා කාලය තුළ රු.582,867/= ක් පමණ ආදායමක් ලැබී ඇති බවත්,සූර්ය පැනලය සඳහා ටෙන්ඩර් කැඳවීමක් සිදුකර නියමිත ආකාරයට ලබාගත් බවත්, පළාත් විදුලි ඉංජිනේරුතුමාගෙන් මේ සම්බන්ධ වාර්තාවක් ලබාගෙන

එම නිර්දේශයන්ට අනුකූලව මෙය සවිකර ඇති බවත් ප්‍රකාශ කළේය. තවද ජෙනරේටරයට හා පෙට්‍රල් සඳහා යන පිරිවැය ද මෙමඟින් වැලකී ඇති බවත් ඉදිරි සියලු වියදම් බොජුන්හල ආදායමෙන් සිදුකිරීමට බලාපොරොත්තු වන බවත් ගරු සභාපතිතුමා විසින් වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදි. ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

II 2023 වර්ෂය සඳහා කාර්යාලයේ පහත සඳහන් විෂයානුකූල සැලසුම් අනුමත කිරීම අවශ්‍ය බව යෝජනා කරන ලදි.

- 2023 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම
- 2023 වර්ෂයේ විගණන සැලැස්ම
- 2023 වර්ෂයේ පුහුණු සැලැස්ම
- 2023 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම
- 2023 වර්ෂයේ කසළ කළමනාකරණ සැලැස්ම
- 2023 වර්ෂයේ ජල අංශයේ වැඩ සටහන්
- 2023 වර්ෂයේ ආයුර්වේද වැඩ සටහන්
- 2023 වර්ෂයේ පුස්තකාල වැඩසටහන්
- 2023 වර්ෂයේ නැණසල වැඩසටහන්

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ආර්.රත්නපාල මැතිතුමා විසින් ස්ථිර කරන ලදුව, ඒකමතිකව සභා සම්මත විය.

III 2023 වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය පත්කර ගැනීම අවශ්‍ය බව යෝජනා කරන ලදි.

එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.එම්.ඉන්ද්‍රජිත් සමන්ජීව මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

මෙම ප්‍රාදේශීය සභාවේ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සඳහා භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයක් පත්කර ගත යුතු බව ප්‍රකාශ කල ගරු සභාපතිතුමා,ඒ සඳහා පහත සාමාජිකයින් තෝරා පත් කර ගන්නා ලදී.

01. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එච්.සිරිපාල මැතිතුමා
02. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඒ.රෝහණ විජේරත්න මැතිතුමා
03. පී.එන්.පිල්ලවත්ත මිය - විමර්ෂණ නිලධාරී
04. එස්.එච්.එච්.එල්.ජයසූරිය මිය - සභාපති
05. ඩබ්ලිව්.එන්.සෙව්වන්දි මිය - සාමාජික
06. කේ.පී.ජී.පී.කුමාරසිංහ මිය
07. ඩී.පී.ප්‍රේමලතා මිය
08. කේ.ඩබ්.ජේ.සුරවීර මයා
09. ජී.කේ.එම්.පී.සෝමදාස මිය
10. එච්.කේ.ඩී.යූ.මධුසංඛ මයා
11. එම්.ටී.ඩී.ධනපාල මිය
12. ජේ.නිශාන්ති දීපිකා මිය
13. පී.එම්.කේ.එස්.මහාබෝධි මිය
14. කේ.ජී.වෛද්‍යාසිංහ මයා
15. පී.කේ.ඩී.සී.කුමාරි මිය
16. යූ.ඩී.නිලන්ත පුෂ්පකුමාර මයා

17. එස්.ඒ.එස්.ටී.සූරියප්පෙරුම මිය
18. යූ.කේ.එල්.කුලරත්න මිය
19. ඩී.කේ.ශාලික සුරංග චන්ද්‍රසේන මයා
20. එම්.බී.වී.කුමාරනායක මයා
21. කේ.කේ.නන්දානිකා මිය
22. ඊ.ඒ.යූ.පී.එම්.එදිරිසිංහ මයා

මෙහිදී භාණ්ඩ සමීක්ෂණය පහත අංශ නියෝජනය කරමින් සිදුවන බව ද ගරු සභාපතිතුමා විසින් ප්‍රකශ කරන ලදී .

- ප්‍රධාන කාර්යාලය/ගබඩාව
- උප කාර්යාලය - වැලිගෙපොල
- මහජන පුස්තකාලය - හුණුවල
- ස්වර්ණ ජයන්ති පුස්තකාලය - වැලිගෙපොල
- ගල්පාය සෙවන පුස්තකාලය
- අකරැල්ල පුස්තකාලය
- ප්‍රජා මණ්ඩලීය පෙර පාසල - ඕපනායක
- සඳගනාගම පෙර පාසල
- ආයුර්වේද බෙහෙත් ශාලාව - හුණුවල
- නැණසල මධ්‍යස්ථානය - ඕපනායක
- මුත්තෙට්ටුපොල පෙර පාසල
- හෙළ බොජුන්හල - ඕපනායක
- කසල මධ්‍යස්ථානය / මළ අපද්‍රව්‍ය පිරිපහදුව

ඒ අනුව ඉහත යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

IV ඕපනායක ප්‍රජා මණඩල භූමියේ ඇති ගොඩනැගිල්ල කඩා ඉවත් කිරීම අවශ්‍ය බව යෝජනා කරන ලදි .

එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී ඒ.ඩබ්.සුමනාවතී මැතිතුමිය විසින් ස්ථිර කිරීමෙන් පසුව ඒකමතිකව සහා සම්මත විය.

V PF- 5490 දරණ කැබ් රථය 2022/11/18 දින හදිසියේ ඇන්ජිමේ ක්‍රියා විරහිත වීම නිසා වූ අළුත්වැඩියාව සඳහා සහා අනුමැතිය ලබා ගැනීම අවශ්‍ය බව යෝජනා කරන ලදි.

එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.කේ.ප්‍රසාද් අසිත මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

මෙහිදී අදහස් දැක්වූ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ජී.යූ.වසන්ත කුමාර මැතිතුමා, 2021වර්ෂයේදීත් විශාල මුදලක් වියදම් කර මෙය අළුත්වැඩියා කළ බැවින් නැවත නැවත අළුත්වැඩියාවට යොමුවීම පිළිබඳව විමසුවේය.

එහිදී අදහස් දැක්වූ ගරු සභාපතිතුමා, පසුගිය කාලයේ ඇති වූ ඉන්ධන අර්බුධය හමුවේ පැවති ඉන්ධන භාවිතයෙන් වූ ගැටළුවක් නිසාවෙන් මෙම දෝෂය හටගෙන ඇති බව පැහැදිලි කළේය. ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

VI SGKF- 3738 දරණ පෞද්ගලික වාහනය, මාසික ඉන්ධන සීමාවන්ට යටත්ව රාජකාරී කටයුතු සඳහා භාවිතා කිරීමට අනුමැතිය ලබා ගැනීම අවශ්‍ය බව යෝජනා කරන ලදි.

එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී වයි.කේ.අයි.තමරා යටිකිඳ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදි.

මෙහිදී අදහස් දැක්වූ ගරු සභාපති.තුමා, මෙම දිනවල මාර්ග සිතියම්ගත කිරිමේ වැඩසටහන සඳහා කාර්යාලයේ තෘ‍ා කැබ් රථය යෙදවීමට වි ඇති බව සහ 5490 කැබ් රථය අළුත්වැඩියාව සඳහා යොමුකර ඇති බැවින් කාර්යාලයේ වෙනත් අවශ්‍යතා සඳහා භාවිතා කිරීමට මෙම පෞද්ගලික වාහනය, ඉන්ධන සීමාවන්ට යටත්ව රාජකාරී කටයුතු සඳහා යොදාගත් බව පැහැදිලි කළේය. ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

VII මළ අපජල පිරිපහදු මධ්‍යස්ථානය මඟින් උත්පාදනය කරනු ලබන ආදායම් බැර කිරීමට නව ගිණුමක් ආරම්භ කිරිමට අනුමැතිය ලබා ගැනීම අවශ්‍ය බව යෝජනා කරන ලදි.

එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.ජී.ශාන්ත දෙල්ගහකොටුව මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

මෙහිදී අදහස් දැක්වූ ගරු සභාපතිතුමා, වැලිගෙපොල ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන ආදායම් උත්පාදන මාර්ගයක් බවට පත් වී ඇති මළ අපජල පිරිපහදු මධ්‍යස්ථානය හා ගලි බවුසර් සේවාව මඟින් උපයනු ලබන ආදායම සභාවේ පොදු ගිණුමෙන් බැහැරව නව ගිණුමක් ආරම්භ කර එහි බැර කිරීමට 2022.11.15 දින මළ අපජල පිරිපහදු මධ්‍යස්ථානය නිරීක්ෂණය කිරීම සඳහා පැමිණි ලෝක බැංකු නියෝජිත කණ්ඩායම උපදෙස් ලබාදුන් බව වැඩිදුරටත් පැහැදිලි කිරීමෙන් පසුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

VIII නව ජල සැපයුමක් ලබාදීමේදී මූලික ගාස්තුව, වාරික වශයෙන් ගෙවීමට අනුමැතිය ලබා ගැනීම අවශ්‍ය බව යෝජනා කරන ලදි

එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.එච්.සිරිපාල මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

මෙහිදී අදහස් දැක්වූ ගරු සභාපතිතුමා, ජල සම්බන්ධතාවයක් ලබාදීම සඳහා ජල සැපයුම් මූලික ගාස්තු වශයෙන් රු.16,250.00 ක මුදලක් සභාවට ගෙවිය යුතු බවත්, දුරිද්‍රතාවයෙන් පසුවන (එකවර මුදල් ගෙවාගත නොහැකි අවස්ථාවලදී),

- පළමු වාරික මුදල ලෙස රු.10,250/= ක්ද ඉතිරිය සමාන වාරික දෙකකින් රු.3000/= බැගින් ජලය ලබාගත් මාසයේ සිට මාස 02ක් ඇතුළත සභාවට ගෙවිය යුතුය.

  නැතහොත්,

- පළමු වාරික මුදල ලෙස රු.6250/= ක්ද ඉතිරිය සමාන වාරික 05කින් රු.2000/= බැගින් ජලය ලබාගත් මාසයේ සිට මාස 05ක් ඇතුළත සභාවට ගෙවිය යුතුය.

IX පී.ඩබ් රංජිත් රණවීර, ඒ.බී.ඒ.එන්. ප්‍රේමරත්න, එස්.එම්.ශෂිකා සඳමාලි හා එම්.රාජේන්ද්‍රන් යන අයගේ සේවය ඉදිරි මාස තුනක් සඳහා මිලදී ගැනීමට අනුමැතිය ලබා ගැනීම අවශ්‍ය බව යෝජනා කරන ලදි

එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.බුද්ධික වීරසිංහ මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් පසුව ඒකමතිකව සභා සම්මත විය.

X ජී.අයි.එස්.තාක්ෂණය භාවිතා කර මාර්ග සිතියම් ගත කිරීමේ වැඩසටහන සඳහා සහභාගිවන බහුකාර්ය හා දෛනික වැටුප් ලබන සේවකයන් හට දීමනාවක් ලබා දීම සඳහා අනුමැතිය ලබා ගැනීම අවශ්‍ය බව යෝජනා කරන ලදි.

එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී එන්.වී.ශ්‍රීමාවතී මැතිතුමිය විසින් ස්ථිර කරන ලදි.

මෙහිදී අදහස් දැක්වූ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.බුද්ධික වීරසිංහ මැතිතුමා,පැය 8 සීමාවෙන් එහාට සේවය කරයිනම් පමණක් මෙම දීමනාව ගෙවීම සුදුසු බව පැවසුවේය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ජී.යූ.වසන්ත කුමාර මැතිතුමා ද මේ සම්බන්ධව කරුණු විමසුවේය.

එහිදී අදහස් දැක්වූ ගරු සභාපතිතුමා, මෙම වැඩසටහන කෙටි කාලයක් තුළ අවසන් කළ යුතු බවත් සභාවේ සහ වැලිගෙපොල ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ බහුකාර්ය සේවකයන් 10 දෙනෙකුද මෙම වැඩසටහනට සම්බන්ධ කරගත බවත් ඕපනායක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මාර්ග සිතියම්ගත කිරීම අවසන් බැවින් මේ දිනවල වැලිගෙපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මාර්ග සිතියම්ගත කරන බවත් ප්‍රකාශ කළේය.
තවද මෙම වැඩසටහන සබරගමුව පළාතේම දියත් කර ඇති බවත් මෙමඟින් ගූගල් සිතියම් නිරීක්ෂණය මෙන්ම ඉදිරියේදී සෑම අයෙකුටම ප්‍රයෝජනවත් වන ආකාරයට මාර්ග සිතියම්ගතවීම තුළින් කාර්යක්ෂම සේවයක් සැපයියහැකි බවත් ගරු සභාපතිතුමා විසින් වැඩිදුරටත් පැහැදිලි කරන ලදි.

XI හෙළ බොජුන්හලේ දිවා ආහාර ලබාදීමට නව පරිශ්‍රයක් ඉදිකිරීම අවශ්‍ය බව යෝජනා කරන ලදි .

එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.එච්.සිරිපාල මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

මෙහිදී අදහස් දැක්වූ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.බුද්ධික වීරසිංහ මැතිතුමා,හෙළ බොජුන්හලේ නව ප්‍රතිසංස්කරණයන් සියල්ල ආදායම මත සිදු කිරීමට හැකිනම් සුදුසු බව පැවසුවේය.

පසුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

XII කිරපත්දෙනිය විහාරස්ථානයේ නායක හාමුදුරුවන්ගේ ආදාහනය වෙනුවෙන් අවශ්‍ය වූ හඬ, පුටු ලබාදීම සඳහා මුදල් ගෙවීම අවශ්‍ය බව යෝජනා කරන ලදි .

එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී වයි.කේ.අයි.තමරා කුමාරි යටිකිඳ මැතිතුමිය විසින් ස්ථිර කිරීමෙන් පසුව ඒකමතිකව සභා සම්මත විය.

XIII අතුරු ව්‍යවස්ථා සම්පාදනය කිරීමේ කමිටුව පත් කර ගැනීම අවශ්‍ය බව යෝජනා කරන ලදි.

එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.එම්.ඉන්ද්‍රජිත් සමන්ජීව මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

මෙම ප්‍රාදේශීය සභාවේ බල ප්‍රදේශය තුළට අදාළ අතුරු ව්‍යවස්ථා කෙටුම්පත් කිරීම සඳහා අප ආයතනයෙන් කමිටුවක් පත් කිරීමට අවශ්‍ය වී ඇති බව ප්‍රකාශ කල ගරු සභාපතිතුමා,ඒ සඳහා පහත සාමාජිකයින් තෝරා පත් කර ගන්නා ලදී.

- විෂය නිලධාරී
- පී.ඩී.ඩී.සෝමසිරි
- ඩී.එම්.එන්.ටී.දිසානායක
- කේ.පී.ජී.පී.කුමාරසිංහ
- එම්.යූ.එන්.කුමාර
- ඩී.අයි.යූ.ජයසිංහ
- යූ.ඩී.නිලන්ත පුෂ්පකුමාර

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

XIV ඕපනායක ප්‍රජා මණ්ඩල භූමියේ පිවිසුම් කාණුව ඉදිකිරීම සඳහා අනුමැතිය ලබා ගැනීම අවශ්‍ය බව යෝජනා කරන ලදි.

එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.ජී.සිසිර ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් පසු ඒකමතිකව සභා සම්මත විය.

XV සබරගමුව පළාත් සභාව මඟින් ක්‍රියාත්මක කරන, ආර්ථික අපහසුතා සහිත පවුල්වල දරුවන්ට පාසල් පොත් හා ඉගෙනුම් ද්‍රව්‍ය ලබාදීමේ වැඩසටහන සඳහා ප්‍රතිපාදන වෙන් කර ගැනීමට අනුමැතිය ලබාගැනීම අවශ්‍ය බව යෝජනා කරන ලදි.

එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.කේ.ප්‍රසාද් අසිත මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

මෙහිදී අදහස් දැක්වූ ගරු සභාපතිතුමා, රටේ පවතින උද්ධමන තත්ත්වය පිළිබඳව අවධානය යොමුකර පළාතේ ආර්ථික අපහසුතාවයට ලක්ව ඇති පවුල්වල දරුවන් සඳහා 2023 නව පාසල් වාරය වෙනුවෙන් අවශ්‍ය වන පාසල් පොත් හා ඉගෙනුම් ද්‍රව්‍ය සහා අරමුදල් මඟින් වැය දරා ලබාදීම සඳහා වැඩසටහනක් සකස් කරන ලෙස සබරගමුව පළාත් ගරු ආණ්ඩුකාරවර ටිකිරි කොබ්බෑකඩුව මැතිතුමා විසින් උපදෙස් දී ඇති බවත් ඒ සඳහා සභා අරමුදලේ මූල්‍ය හැකියාව හා සභාවට ඉටු කිරීමට පවතින කාර්ය කර්තව්‍යද අධ්‍යනය කර වැඩසටහන් සඳහා ප්‍රතිපාදන සලසා ගැනීමට අවශ්‍ය ඇති බවත් වැඩිදුරටත් පැහැදිලි කළේය. ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

XVI කල් ඉකුත් වූ තැන්පතු නියාදනය කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීම අවශ්‍ය බව යෝජනා කරන ලදි.

එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.එල්.ලාල් කුමාරරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

මෙහිදී අදහස් දැක්වූ ගරු සභාපතිතුමා, 1998 වර්ෂයේ සිට 2021 වර්ෂය වන තෙක් තැන්පත් ලේඛණයේ ලේඛණගතව, නොගෙවී ඉතිරිව ඇති,

| | |
|---|---|
| කර්මාන්ත තැන්පත් | රු.10,595.63 |
| මිශ්‍ර තැන්පත් | රු.85,760.00 |
| පරිසර ඇප තැන්පත් | රු.33,000.00 |

වශයෙන් රු.127,355.63 ක මුලක් ඉතිරිව ඇති බවත් මෙම මුදලට අදාළ පුද්ගලයන් විසින් එම මුදල් දෙන ලෙස ඉල්ලීම්ද ඉදිරිපත් කර නොමැති අතර මුදල් රෙගුලාසි 570,571 ට අනුව ඉකුත් වූ තැන්පතු නියාදනය කල හැකි බැවින් ඉහත එම මුදල සභාවේ ආදායමක් ලෙස සමුච්චිත අරමුදලට ගැලපීමට සහ යම් හෙයකින් මෙම මුදල් සම්බන්ධයෙන් කිසියම් අවස්ථාවක ඉල්ලීමක් ඉදිරිපත් වුවහොත් එම මුදල සමුච්චිත අරමුදලින් නිදහස් කිරීමටද සභා අනුමැතිය ගතයුතු බව පැහැදිලි කළේය. ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

XVII ආගමික සිද්ධස්ථාන සහ පෙර පාසැල් සඳහා සභාව සතු ජංගම කූඩාරම් 5 සහ GI බට ලබාදීම සඳහා අනුමැතිය ලබාගැනීම. (2022/08/18 දින පැවති මාසික මහා සභාවේ තීරණ අංක 5.1(VII) ට අමතරවයි) අවශ්‍ය බව යෝජනා කරන ලදි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ඒ.ඩබ්.සුමනාවතී මැතිතුමිය විසින් ස්ථිර කරන ලදි.

මෙහිදී අදහස් දැක්වූ ගරු සභාපතිතුමා, සභාව සතු ජංගම කූඩාරම් සහ GI බට ගබඩා කිරීම සඳහා, ගබඩා පහසුකම් ප්‍රමාණවත් නොවීම හේතුවෙන් මේ වන විට දිරායාමට ලක්වී ඇති බැවින් සභාවේ අවශ්‍යතාවය සඳහා බට 50ක් පමණ රඳවාගෙන ඉතිරි ප්‍රමාණය හා කූඩාරම් 05ක් ලියාපදිංචි ග්‍රාමීය සමිති වලට අමතරව ආගමික සිද්ධස්ථාන සහ පෙර පාසැල් සඳහා ලබාදීම සුදුසු බව ප්‍රකාශ කළේය. ඒ අනුව මෙම කූඩාරම් සහ GI බට ලබාදීමට තීරණය වූ අතර එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

XVIII දෙනිය විහාරස්ථානයේ නායක හාමුදුරුවන්ගේ ආදාහනය වෙනුවෙන් අවශ්‍ය වූ හඬ, පුටු ලබාදීම සඳහා මුදල් ගෙවීම අවශ්‍ය බව යෝජනා කරන ලදි .

එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.එම්.අයි.පී.රණතුංග මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් පසුව ඒකමතිකව සභා සම්මත විය.

XIX 2023 වර්ෂයේ මාසික සභා රැස්විම සඳහා දින නියම කර ගැනිම අවශ්‍ය බව යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ආර්.රත්නපාල මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව සම්බන්ධයෙන් සියළුම ගරු මන්ත්‍රීතුමන්ලා මන්ත්‍රීතුමියන්ලා විසින් 2023 වර්ෂයේ මාසික සභා රැස්වීම සඳහා පෙර පරිදිම සෑම මසකම දෙවන බ්‍රහස්පතින්දා දින පැවැත්වීම සුදුසු බවත්,එදින රජයේ නිවාඩු දිනයක් වන අවස්ථාවක වෙනත් දිනයක් ආදේශ කර ගනිමින් පහත සඳහන් පරිදි සභා රැස්වීමේ දිනයන් තීරණය කරන ලදී.

| <u>මාසය</u> | | <u>දිනය</u> |
|---|---|---|
| 2023 | -ජනවාරි | 12 |
| | -පෙබරවාරි | 09 |

-මාර්තු 09
-අප්‍රේල් 06
- මැයි 11
- ජූනි 08
- ජූලි 13
- අගෝස්තු 10
- සැප්තැම්බර් 07
- ඔක්තෝම්බර් 12
- නොවැම්බර් 09
- දෙසැම්බර් 14

ඒ අනුව ඉහත සඳහන් දිනයන්හිදී මාසික සභා රැස්වීම් පැවැත්වීමට මහ සභාවේ ඒකමතික අනුමැතිය හිමි විය.

## 5.2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.සිසිර ප්‍රේමකුමාර මැතිතුමා

I අකරුල්ල ග්‍රාම නිලධාරී වසම තුළ පවුල් සඳහා සුසාන භූමියක් ලබා ගැනීම.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.බුද්ධික වීරසිංහමැතිතුමා විසින් ස්ථිර කිරිමෙන් පසුව ඒකමතිකව සභා සම්මත විය.

6. **<u>කාරක සභා වාර්තා සලකා බැලීම.</u>**

## 6.1. මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කමිටු වාර්තා

2022.11.10 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභා වාර්තාව මහා සභාවේ සලකා බැලීම පිණිස ඉදිරිපත් කරන ලදී.

## 6.2. ප්‍රසම්පාදන වාර්තා

2022.09.08, 2022.09.16, 2022.09.29, 2022.10.13 හා 2022.10.17 වන දින පැවති ප්‍රසම්පාදන කමිටු වාර්තා මහා සභාවේ සලකා බැලීම පිණිස ඉදිරිපත් කරන ලදී

7. **ආදායම් වියදම් වාර්තා**

## 7.1. 2022 ඔක්තෝබර් මස ආදායම් වියදම් වාර්තාව

| ලැබීම් සාරාංශය | (රුපියල්) | වැය සාරාංශය | (රුපියල්) |
|---|---|---|---|
| වරිපනම් බදු | 628,386.22 | වැටුප් හා දීමනා | 4,447,743.83 |
| කුලී | 543,606.14 | ගමන් වියදම් | 16,600.00 |
| බලපත්‍ර ගාස්තු | 3,000.00 | සැපයුම් හා උපකරණ | 1,117,162.00 |
| සේවා සඳහා ගාස්තු | 42,340.00 | ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියා හා නඩත්තුව | 217,952.50 |

| | | | |
|---|---|---|---|
| වරෙන්තු ගාස්තු හා දඩ | 1,495.06 | ප්‍රවාහන සම්බන්ධතා හා ආවශ්‍යක සේවා | 394,553.04 |
| වෙනත් ආදායම් | 1,928,803.74 | පොලී ගෙවීම් ලාභාංශ හා ප්‍රසාද මුදල් | - |
| වෙනත් ආධාර | 3,892,877.79 | ආධාර මුදල් දායක මුදල් සහනාධාර | - |
| පුනරාවර්ථන ආදායම් එකතුව | 7,040,508.95 | විශ්‍රාම වැටුප්,විශ්‍රාම ප්‍රතිලාභ,හා පාරිතෝෂික | 43,612.55 |
| මූලධන ලැබීම් | - | පුනරාවර්තන වියදම් එකතුව | 6,237,623.92 |
| ප්‍රාග්ධන ආදායම් එකතුව | - | ප්‍රාග්ධන වැය | 379,611.50 |
| පුනරාවර්ථන/ ප්‍රාග්ධනආදායම් එකතුව | 7,040,508.95 | ණය ආපසු ගෙවීම් | - |
| සේවක ණය | 132,164.67 | සේවක ණය | 50,000.00 |
| තැන්පත් | 112,339.00 | තැන්පත් | 81,939.81 |
| අත්තිකාරම් | 234,450.00 | ණයහිමි | 160,800.00 |
| ණය ගැති(කර්මාන්ත) | - | අත්තිකාරම් | 229,500.00 |
| සමුච්චිත අරමුදල | 526,428.64 | ජල ගබඩා | - |
| | | ගබඩා(ඖෂධ) | 100,000.00 |
| වෙනත් ලැබීම් එකතුව | 1,005,382.31 | සමුච්චිත අරමුදල | 526,428.64 |
| | | වෙනත් ගෙවීම් | - |
| | | වෙනත් ගෙවීම් එකතුව | 1,148,668.45 |
| මුළු එකතුව | 8,045,891.26 | මුළු ගෙවීම් | 7,765,903.87 |

## 7.2. 2022 ඔක්තෝබර් 31 දිනට ආදායම් අය කිරීමේ ප්‍රගති වාර්තා

ඇමුණුම 1 යා කර ඇත.

## 8. පසුගිය සභා රැස්වීමේ ප්‍රගතිය සමාලෝචනය කිරීම

- පසුගිය සභා රැස්වීමට ඉදිරිපත් වූ යෝජනා විෂය නිලධාරීන් වෙත යොමුකර ඇති බව, ප්‍රකාශ කරන ලදී.

## 9. වෙනත් කරුණු

## 9.1. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ජී.යූ. වසන්ත කුමාර මැතිතුමා

මෙහිදී අදහස් දැක්වූ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ජී.යූ.වසන්ත කුමාර මැතිතුමා, හුණුවල වසම තුළ පාසල අසල වන කුඹුරුගොඩ කිරීම සිදු කරන්නන් කුමන කටයුත්තකට ද යන්න විමසූ අතර, ඒ සඳහා විරෝධයක් නොමැති බවත් පාසලට හා අළුදෙනිය මාර්ගයට හානියක් නොවන අයුරින් කාණු පද්ධතියට බාධා නොවන සේ සකස් කරන ලෙස ඉල්ලා සිටියේය.

තවද වසර පහකට පමණක් මහජනතාව විසින් බලය ලබාදී ඇති බැවින් පවතින දේශපාලන ක්‍රමය වෙනස් කළ යුතු බවත් සුදුසු ජනවරමක් යෝජනා කිරීම සඳහා සියළු දෙනා එක්විය යුතු බවත් පැවසූ ගරු මන්ත්‍රීතුමා වර්ථමානයේ සැමතැනම විවධ මත්ද්‍රව්‍ය  වර්ග බහුල වී ඇති බැවින් සමාජය ඛේදනීය තත්ත්වයකට පත්වී ඇති බවද පෙන්වා දුන්නේය.

## 9.2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ජී.ශාන්ත දෙල්ගහකොටුව මැතිතුමා

මෙහිදී අදහස් දැක්වූ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී .ජී.ශාන්ත දෙල්ගහකොටුව මැතිතුමා, පවතින ආර්ථික අර්බුදය හමුවේ සභා බල ප්‍රදේශය තුළ පාසල් ළමුන් සඳහා නිල ඇඳුමට සපත්තු අනිවාර්ය නොකර සිටිමට හැකිනම් සුදුසු බවද එය අධ්‍යාපන අමාත්‍යංශය වෙත දන්වා අවශ්‍ය කටයුතු කරන ලෙසද ඉල්ලා සිටියේය.

## 9.3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එල්.ලාල් කුමාරරත්න මැතිතුමා

මෙහිදී අදහස් දැක්වූ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එල්.ලාල් කුමාරරත්න මැතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ඒ.දමිත් විජේරත්න මැතිතුමා විදේශ ගත වී ඇති බැවින් සභා වාර 03ක් සඳහා නොපැමිණිම හේතුවෙන් නිවාඩු අනුමත කරන ලෙස ඉල්ලීමක් සිදුකර ඇති බවත් මෙම ගරු මන්ත්‍රීතුමා නියෝජනය කරනු ලබන පක්ෂ මූලස්ථානයට මේ සම්බන්ධව වාර්තා කළයුතු බව ද සඳහන් කළේය.

තවද ගරු මන්ත්‍රීතුමා, හඳගිරිය කපුගල මාර්ගය දෙපස එළි පෙහෙළි කළද මාර්ගයට නැමී ඇති  ගස් හා අතු ඉවත් කර නොමැති බැවින් ඒ සඳහා අවශ්‍ය ස්ථාන දැනුවත් කර එය ඉටුකර දෙන මෙන් ඉල්ලා සිටි අතර හඳගිරිය කොට්ඨාසයේ බෙලිමාලියද්ද  සහ උඩගම්ගොඩ වසම් සඳහා දුරකථන සම්ප්‍රේෂණ තරංග නොමැතිවීම හේතුවෙන් එම වසම් වල ජනතාව දැඩි අපහසුතාවයට පත්වී ඇති බැවින් මොබිටෙල් සම්ප්‍රේෂණ කුළුණක් ලබා ගැනීම සඳහා අවශ්‍ය ස්ථාන දැනුවත් කරන ලෙසද ඉල්ලා සිටියේය.

බුරුතගොඩ ,තිත්තවැල් කුණ්ඩිය යන ප්‍රදේශවල ගොවීන් නීතිය හමුවේ අපහසුතාවයට පත්වී ඇති බවත් තවම එම ගොවීන්ගේ වගාබිම් පිළිබඳව ප්‍රශ්ණය නිරාකරණය නොවුණු බවත් පෙන්වා දුන් ගරු මන්ත්‍රීතුමා 2023 වර්ෂයේදීවත් මෙම ගැටලුව නිරාකරණය කොට එම ගොවීන්ට නිදහසේ ගොවිතැන් කටයුතු කරගෙන යැමට හා ආහාර නිෂපාදනය සඳහා අවස්ථාව සලසා දෙන ලෙසද සඳහන් කළේය.

එමෙන්ම හඳගිරිය තණ බිම් ආශ්‍රිතව බඩ ඉරිඟු වගා කිරීමේ ව්‍යාපෘතිය සිදුකර ගැනීමට ආයෝජනය කළ හැකි ලාංකීය සමාගමක් සමඟ සාකච්ජා කර මෙම ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය  දෑ ලබාදීමට හැකිනම් මෙම ප්‍රදේශය දියුණු කර ගැනීමට හැකිවන බවද ප්‍රකාශ කළ අතර වර්ථමානයේ පාසැල් අවට සීඝ්‍රයෙන් පැතිරෙන මත්ද්‍රව්‍ය තුරන් කිරීමට අවශ්‍ය ස්ථාන හා දිස්ත්‍රික් සම්බන්ධීකරණය දැනුවත් කර අනාගතය භාර ගැනීමට සිටින දරු පරපුර ආරක්ෂා කර දෙන මෙන් ඉල්ලා සිටියේය.

## 9.4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.බුද්ධික වීරසිංහ මැතිතුමා

ගොඩකවෙල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් වැලිගෙපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රංවල, ගල්පාය, අම්බැවිල ආදී ප්‍රදේශ නියෝජනය කරමින් බස් රථ ධාවනය කරනු ලබන්නේ ගොඩකවෙල ඩිපෝව මඟින් බවද  නමුත් මේ වන විට එම බස් රථ දෙනියාය ඩිපෝවට අනියුක්ත කිරීමට කටයුතු සිදුවෙමින් පවතින බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.බුද්ධික වීරසිංහ මැතිතුමා කරුණු අනාවරණය කළ අතර එම බස් රථ දෙනියාය ඩිපෝවට අනුයුක්ත කළහොත්, අදාළ ඩිපෝව වැසී යාමේ වැඩි අවධානමකට මෙන්ම ප්‍රදේශ වාසීන් මහත් අපහසුතාවයකට පත්වෙන බැවින් ඒ සම්බන්ධව  අවශ්‍ය කටයුතු කිරීම

සඳහා අදාළ ස්ථාන වලට දැනුම් දී ඉදිරි කටයුතු කරන ලෙස ඉල්ලා සිටි අතර ලබන්නා වූ නව වසර සැමටම යහපතක් වන නව වසරක් වේවා! යි ප්‍රාර්ථනා එක් කළේය.

## 9.5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී එන්.වී.ශ්‍රීමාවතී මැතිතුමිය

කීරපත්දෙනිය විහාරස්ථානයේ විහාරාධිපති වහන්සේ අපවත් වූ අවස්ථාවේ සභාව මගින් විශාල දායකත්වයක් ලබා දුන් බැවින් ඒ සඳහා සිය ස්තූතිය පුද කළ ගරු මන්ත්‍රීතුමිය තවද තම ඥාතියෙකුගේ අවසන් කටයුතු කර ගැනීමට ද ජල බවුසරය ලබාදීම පිළිබඳව ස්තූති කළාය. එමෙන්ම යටිපස්ගමුව මාර්ගය සම්බන්ධව 2022 අගෝස්තු මස ලියුමක් යවා ඇති බවත් එම ගස් ඉවත් කරගන්නේ නැත්නම් සභාවේ යන්ත්‍ර යොදවා ඉවත් කර අලාභය අය කළයුතු බවද මේ මාසය තුළ එය ඉටුකර දෙන ලෙසද ඉල්ලා සිටියාය.

තවද පාසල් සිසුන් විශාල වශයෙන් මත්ද්‍රව්‍ය භාවිතයට හුරු වී ඇති බවත් මෙය වැලක්වීම සඳහා විවිධ විකල්පයන් භාවිතා කළද එය සාර්ථක නොවන බැවින් ප්‍රාදේශීය සම්බන්ධීකරණය දැනුවත් කර නිසි ක්‍රියාමාර්ග ගන්නා ලෙසද ගරු මන්ත්‍රීතුමිය විසින් වැඩිදුරටත් ඉල්ලා සිටින ලදි. එමෙන්ම පසුගිය කාලයේ පොදු සංවර්ධනය ඉටුකිරීම පිළිබඳ ස්තූතිවන්ත වන අතර වැලිගෙපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයටද යමක් කරන මෙන් ඉල්ලා සිටියාය.

## 9.6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී වයි.කේ.අයි.තමරා කුමාරි යටිකිඳ මැතිතුමිය

එහිදී අදහස් දැක්වූ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී වයි.කේ.අයි.තමරා කුමාරි යටිකිඳ මැතිතුමිය, 2023 වර්ෂයට අදාළ අයවැය කෙටුම්පතේ සංශෝධනය කර ඇති පෙර පාසල් සඳහා උපකරණ ලබා ගැනීම වෙනුවෙන් ප්‍රතිපාදන වෙන් කිරීම රු.600,000/= දක්වා වැඩි කිරීම පිළිබඳ සතුටු වන අතර ඕපනායක ප්‍රජා මණ්ඩල ගොඩනැගිල්ල කඩා ඉවත් කිරීමේදී එම ද්‍රව්‍ය තවත් අසරණ දරුවන් සිටින පෙර පාසලකට නැවත ගත හැකි අයුරින් කඩා ඉවත් කරන ලෙසද ඉල්ලා සිටියාය.

තවද ගරු සභාපතිතුමා විසින් මෙම බල ප්‍රදේශයට මහඟු සේවයක් ඉටුකළ අතර ඉදිරියේදීත් එම සේවය ලබා දීමට හැකියාව ලැබේවායි පතමින් 2023 වර්ෂය සියලූම දෙනාට සුභ නව වසරක් වේවායි ප්‍රාර්ථනා එක් කළාය.

## 9.7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ඒ.ඩබ්ලිව්.සුමනාවතී මැතිතුමිය

මෙහිදී අදහස් දැක්වූ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ඒ.ඩබ්ලිව්.සුමනාවතී මැතිතුමිය, බලංගොඩ රත්නපුර මාර්ගයේ කරගහයට බස් නැවතුම්පළ ඉදිකිරීම සම්බින්ධයෙන් විමසූ අතර ඊට අදාළ වන්දි මුදල හෝ ලබා ගැනීමට කටයුතු කරන මෙන් ඉල්ලා සිටියාය. එමෙන්ම ගරු සභාපතිතුමා විසින් පසුගිය කාලය පුරා මෙම ප්‍රදේශයට බොහෝ සංවර්ධන කටයුතු ඉටුකළ බවද එම සේවය වෙනුවෙන් සභාපතිතුමා ප්‍රමුඛ කාර්ය මණ්ඩලයටත් සිය ස්තූතිය පුද කළ අතර ඉදිරියටත් එම සේවය ලබා දීමට හැකිවේවා යි පතමින් ලබන්නා වූ 2023 වර්ෂය සැමටම සුභ නව වසරක් වේවායි ප්‍රාර්ථනා එක් කළාය.

## 9.8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී. සිසිර ප්‍රේමකුමාර මැතිතුමා

මෙහිදී අදහස් දැක්වූ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.සිසිර ප්‍රේමකුමාර මැතිතුමා, අකරැල්ල වතු රෝහල අභාවයට පත්ව ගොස් ඇති බැවින් අකරැල්ල විහාරස්ථානයේ විහාරාධිපති ස්වාමීන් වහන්සේ ප්‍රමුඛව ගම්වාසීන් එකතු වී මෙම භූමිය සුද්ද පවිත්‍ර කරද දැනට ගොඩනැගිල්ලක් පමණක් ඉතිරිව තිබෙන බැවින්

මෙම රෝහලට අවශ්‍ය වෛද්‍යවරයෙකු ලබාදී මෙම රෝහල නැවත දියුණු කර දෙන මෙන් ඉල්ලා සිටි අතර ඒ සඳහා අවශ්‍ය බලධාරීන් වෙත දන්වන ලෙසද ඉල්ලා සිටියේය.

තවද අකරැල්ල වසම තුළ මත්ද්‍රව්‍ය වැඩි වශයෙන් භාවිතයේ තිබෙන බවද මෙය පාලනය කිරීමට ඒ සම්බන්ධව පතකර ඇති බලධාරීන්ට හැකි බවත් සැවොම එක්ව මෙම ඛේදනීය තත්ත්වය වැලැක්වීමට කටයුතු කළ බවද පෙන්වා දන් ගරු මන්ත්‍රීතුමා ලබන්නා වූ 2023 වර්ෂය පක්ෂ භේදයකින් තොරව සැමටම එකසේ සතුට සෞභාග්‍ය උදාවේවා ! යි ප්‍රාර්ථනා එක් කළේය.

## 9.9. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී පී.ආර්.එස්.ධම්මිකා මැතිතුමිය

ආර්ථික අපහසුතා තියෙන ළමුන් සඳහා අවශ්‍ය ඉගෙනුම් ද්‍රව්‍ය ලබාදීමේ වැඩපිළිවෙල ක්‍රියාත්මක කරන විට එම දරුවන් තෝරා ගැනීමේදී සියලුම මන්ත්‍රීවරුන් හා මන්ත්‍රීවරියන් දැනුවත් කරන ලෙස ඉල්ලා සිටි ගරු මන්ත්‍රීතුමිය, ඌරාවල කොහු කර්මාන්තය පරිහානියට පත්ව ඇති බවත් ඒ සම්බන්ධව දිස්ත්‍රික් සම්බන් සසම්බින්ධීකරණයට දන්වන ලෙසත් ඉල්ලා සිටියාය.

තවද පසුගිය කාලය තුළ සභාවට ඉදිරිපත් කරන ලද සිය යෝජනා සියල්ල ඉටු නොවුන බවත් ඌරාවල පාර දෙපස එළි පෙහෙළි කරන ලෙස ඉල්ලා සිටියද එය තවමත් ඉටු නොවුන බැවින් 2022 වර්ෂය අවසන් වීමට පෙර එය ඉටුකර දෙන ලෙස ගරු මන්ත්‍රීතුමිය නැවතත් ඉල්ලා සිටියාය.

## 9.10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මන්ත්‍රී ආර්.ඒ.රෝහණ විජේරත්න මැතිතුමා

මෙහිදී අදහස් දැක්වූ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඒ.රෝහණ විජේරත්න මැතිතුමා, පසුගිය කාලය පුරාවටම ප්‍රාදේශිය සභා මන්ත්‍රීවරුන් ලෙස ඒ ඒ නායකයින් කියන ආකාරයට කටයුතු කලද වර්ථමානය වන විට ජනතා මතය මුදුන්පත් වී ඇති බවද පසුගිය කාලයේ සිදුවන වැරදි ඔවුන් විසින් පෙන්වා දෙන බවද ප්‍රකාශ කළේය.

එමෙන්ම වර්ථමානය වන විට මෙම පාලන ක්‍රමය අනුව භෞතික සම්පත් කොපමණ තිබුණද මානව සම්පත මට්ටමින් එය ශූන්‍ය වී ඇති බවද ගරු මන්ත්‍රීතුමා විසින් වැඩිදුරටත් ප්‍රකාශ කළ අතර ලබන්නා වූ 2023 වර්ෂය සැමටම බත බුලතින් සරුවන නව වසරක් වේවා! යි ප්‍රාර්ථනා එක් කළේය.

### සභා රැස්වීමේ නිමාව

ජනතා මතය මුදුන්පත්වී ඇති යුගයක එකී මතයට ප්‍රමුඛතාවය දී කටයුතු කළ යුතු අතර ගෙවුනු අසිරු කාලසීමාවෙන් මිදී නව අරුණාලෝකයක් සමඟ නැවත රැස්වීමට බලාපොරොත්තුවන බවත්, අද දින රැස්වීමේ කටයුතු සාර්ථකව කරගෙන යැමට සහය ලබාදුන් සියළු දෙනාට සිය ස්තූතිය පුදකර සිටින බවත් පැවසූ ගරු සභාපතිතුමා, ලබන්නා වූ 2023 වර්ෂය සැමටම සෞභාග්‍යමත් සුභ නව වසරක් වේවා! යැයි පතමින් දහවල් 12.30 ට පමණ සභා රැස්වීමේ කටයුතු නිමාවට පත්කළේය.

කැළුම් ප්‍රියංකර ජයසිංහ,
සභාපති,
වැලිගෙපොල ප්‍රාදේශීය සභාව